# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2062/33 - 2018 මාර්තු මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් රනිල් වික්‍රමසේකර වන මම 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66 ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත තුළ පිහිටියා වූ මෙහි පහත උපලේඛනය යටතේ නම් සඳහන් පළාත් පාලන ආයතන සඳහා නගරාධිපති/සභාපති, නියෝජ්‍ය නගරාධිපති/උප සභාපති තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා වන පළමු රැස්වීම පහත උපලේඛනය යටතේම අනුරූපීව දක්වා ඇති දිනයෙහි නියමිත වේලාවට එහි සඳහන් කර ඇති ස්ථානයේ දී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

රනිල් වික්‍රමසේකර,
පළාත් පාලන කොමසාරිස්,
දකුණු පළාත.

2018 මාර්තු මස 15 වෙනි දින,
6 වන මහල, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි,
දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| අනු අංකය | පළාත් පාලන ආයතනයේ නම | තෝරා පත් කරනු ලබන ධූරය | කැඳවනු ලබන දිනය | කැඳවනු ලබන වේලාව | කැඳවනු ලබන ස්ථානය |
|---|---|---|---|---|---|
| 1 | ගාල්ල මහා නගර සභාව | ගරු නගරාධිපති, ගරු නියෝජ්‍ය නගරාධිපති | 2018.03.23 | පෙ. ව. 9.30 | ගාල්ල මහා නගර සභාවේ සභා රැස්වීම් ශාලාව |
| 2 | හම්බන්තොට මහා නගර සභාව | ගරු නගරාධිපති, ගරු නියෝජ්‍ය නගරාධිපති | 2018.03.28 | පෙ. ව. 10.00 | හම්බන්තොට මහා නගර සභාවේ සභා රැස්වීම් ශාලාව |
| 3 | තංගල්ල නගර සභාව | ගරු සභාපති, ගරු උප සභාපති | 2018.03.26 | පෙ. ව. 10.00 | තංගල්ල නගර සභාවේ සභා රැස්වීම් ශාලාව |
| 4 | අම්බලන්ගොඩ නගර සභාව | ගරු සභාපති, ගරු උප සභාපති | 2018.03.27 | පෙ. ව. 10.00 | අම්බලන්ගොඩ නගර සභාවේ මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ උඩු මහලේ පිහිටි ශාලාව (නගර සභාව ඉදිරිපිට ඇති ප්‍රධාන පුස්තකාලයේ) |

03 - 1324


1A - PG 3944 — 08 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.